## ලන්ඩනයේ සොඳුරු සූපවේදියාණෝ

# ආදරණීය 'බණ්ඩයියා'!

f අකුර මුලට යෙදූ පරුෂ වචනයෙන් මුළුතැන්ගෙයි පෝටර්ලා සහ කෝකියන්ට බැණවදින, හිනා පුළුටක් මුහුණේ නැති, මූසල පෙනුමක් ඇති ගෝඩන් රැම්සේ හෝ, පාසැල් ආහාරය සපයන තරුණ ජේමි ඔලිවර් හෝ බීබීසී කාරයින්ට මහා සූප ශාස්ත්‍රකාරයින් සේ පෙනෙන්ට පුළුවන. එහෙත් ප්‍රසන්නතාවෙන් මෙන්ම උපේක්ෂා වෙන්ද උන් දෙදෙනට ගව් ගණනකින් වත් සමීප විය නොහැකි සූපවේදියාණෝ කෙනෙක් ලන්ඩනයේ අප අතර වෙසෙති. මේ සටහන අද මා ලියනුයේ ඒ සොඳුරු මිනිසා ගැනය.



හිතවත්කමටත්, වැඩිමහල්කමටත් එක සේ ගරුකිරීමක් වශයෙන් එක්සත් රාජධානියේ වෙසෙන බහුතර ශ්‍රී ලාංකික ජන කොට්ඨාශය අතරේ බණ්ඩයියා යන ආදර නාමයෙන් හැඳින්වෙන ඔහුගේ සම්පූර්ණ නම, මාපා මුදියන්සේලාගේ හීන් බණ්ඩාය. මාතලේ උපත ලබා එහිම හැදුණු වැඩුණු හීන්බණ්ඩා මහතා තරුණවියේදී කොළඹ පැමිණියේ දන්ත වෛද්‍ය කාර්මිකයෙකු වීමේ අභිලාෂයෙනි.එහිදී ඔහුට මුණගැසුණු දන්ත වෛද්‍යවරයෙකු යටතේ පුහුණුව ලැබූ හෙතෙමේ 1960 වර්ෂයේ දී තම ස්වාමියා සමග එංගලන්තයට පැමිණියේය. එම අවස්ථාවෙන් මනා ප්‍රයෝජනයක් ගත යුතු යයි සිතූ බණ්ඩයියා, ලන්ඩනයේ උසස් අධ්‍යාපන පීඨයකට බැඳී දන්ත කාර්මික විද්‍යාව පිළිබඳ අධ්‍යනය කොට පුහුණුව ලැබුවේය. එහෙත් අවසාන විභාගයට පෙනී සිටීමට තිබූ දිනයට කලින් සතියේ ඔහු බලවත් ලෙස රෝගාතුර වූයෙන් එම විභාගයට පෙනී සිටීමට හැකිවූයේ නැත.



හීන්බණ්ඩා යුවළ තම දියණියන් තිදෙන සමග

එම සිද්ධියෙන් ඉමහත් කලකිරීමට පත් ඔහු දන්ත කාර්මික විද්‍යාව අතහැර දමා එකල ශ්‍රීලංකා මහ කොමසාරිස් කාර්‍යාලයේ ගොඩනැගිලි පාලක තන තුරට පත්විය. ඔහු එහි වසර ගණනක් සේවය කර ඇත. ඒ අවධියේ ලන්ඩනයේ මහ කොමසාරිස් ධුරය දැරූ වේ මහාචාර්‍ය ජී. පී. මලලසේකර මැතිතුමා බව අපි දැනගතිමු. තානාපති කාර්‍යාලයේ සේවය කරන අතරතුර දී මුණගැසුණු පැරණි මිතු රෙකු නිසා බණ්ඩයියාගේ වෘත්තිය සම්පූර්ණයෙන් වෙනස් මගකට යොමුවූ බව ඔහුගේ අදහසයි.

එනම්, ලන්ඩනයට එතෙක් අඩුවක්ව පැවති සිංහළ අවන්හලක් ආරම්භ කිරීමයි. සිංහළ අවන්හල් අද මෙන් සුලභව නොතිබූ අවධියක





හීන්බණ්ඩා යුවළ විවාහ වූ අළුත 1967 දි

සිංහළ කෑම වේලක රස බැලීමට එන ශ්‍රීලාංකිකයින් හා විදේශිකයින් අතර ඉතා කෙටි කලකින් ජනප්‍රිය වූ එම අවන්හලට දේශීය මෙන්ම විදේශීය මැති ඇමතිවරුන් ද, වෙනත් සම්භාවනීය අමුත්තන්ද නිතර ආ ගිය බව බණ්ඩයියා පවසයි. එලෙසම ඔහු ළඟ ඇති අනේක විධ පුද්ගලයින් සමග ගන්නා ලද ඡායාරූප දහස් ගණනක් ඊට දෙස් දෙයි. සිංහළ කෑම පිළියෙල කිරීම ගැන ක්‍රමවත් හැදෑරීමක් කර නොතිබුණ ද, ඒ පිළිබඳව කිසිවෙකුගෙන් ගුරුහරුකම් ලබාගෙන නොතිබුණ ද, බලා සිටීමෙන් හා තමාගේම අත්හදා බැලීම් ඇසුරෙන් විවිධ විශේෂ සූප විධි නිර්මාණය කරගත් බව බණ්ඩයියා පවසයි. කටට රහට දිවට සිංහල කෑම වර්ග පිළියෙල කිරීම සම්බන්ධයෙන් අද ඔහු සිටින්නේ ඉතා ඉහළ තලයක ය. එසේම ඒ සියල්ල අභිබවා යමින් ඔහු පිළියෙල කරන ගෝදම්බ රොටි විශේෂ තැනක් ගන්නා බව නොකියා බැරි ය.

වරක් ශ්‍රීලංකා හෝටල් ගණනක අනුග්‍රහයෙන් ලාංකික කෑම වර්ග විදෙස් රටවල ප්‍රචලිත කිරීමේ අදහසින් ලන්ඩනයේ මහ හෝටලයක පැවති ආහාර ප්‍රදර්ශනයකදී ගෝදම්බ රොටි නැති අඩුපාඩුව මගහැරවීමේ කාර්යය භාරවී ඇත්තේ බණ්ඩයියාට ය.

බණ්ඩයියා මෙන්ම ඔහුගේ ආදරණීය බිරිඳ ශීලා ද මෙහි සිටින ශ්‍රීලාංකිකයින්ගේ ආදරය මෙන්ම හොඳහිත දිනාගත් කාන්තාවකි. ඇය ලන්ඩනයේ යුනිවර්සිටි කොලේජ් රෝහළේ වසර තිස් ගණනක සේවයෙන් පසු අද විශ්‍රාම ලබා සිටින්නී ය.

ලන්ඩන් මහකොමසාරිස් කාර්‍යාලයේ තමා හා එක්ව සේවය කළ වයසක කාන්තාවකගේ හඳුන්වාදීමේ ප්‍රතිඵල යක් වශයෙන් මුණ ගැසුණු කඩවත, ශීලා කරස්නාගොඩ මෙනවිය සමග වසර කිහිපයක ඇසුරකින් පසු ඔහු විවාහ වූ අතර, ඒ දෙදෙනට ලලන්තා, සුජීවා, ශ්‍යාමා යනුවෙන් දියණියන් තිදෙනෙක් සිටිති. ඒ දැරියන් තිදෙන කුඩා කල සිටම සිංහළ චාරිත්‍ර අනුව, බුදු දහමට නැඹුරු කොට, සිංහළ කලා ශිල්ප අගය කරන වාතාවරණයක ඇති දැඩි කිරීමට බණ්ඩයියා සහ ශීලා ගත් ප්‍රයත්නය අද මල්පල ගැන්වී තිබේ. ඒ දියණියන් සුප්‍රකට නාට්‍ය ශිල්පිණී විපුලි සමරසිංහ මහත්මිය යටතේ නැටුම් කලාව හදාරා රංගන කීපයකම අගේට තම දක්ෂතා ලන්ඩනයේ ප්‍රේක්ෂක අප ඉදිරියේ විදහා පෑ අයුරුත්, එපමණක් නොව බණ්ඩයියා ද විපුලිගේ ඒ එක් ප්‍රසංගයක චරිතයක් රඟ දැක්වූ ආකාරයත් මට දැනුදු මතක් වේ.

ඒ දැරියන් තිදෙනම දැන් විවාහකය. දියණියන් ලත් දරුවන් හත් දෙනෙකුගේ හෙවත් ඒ මුනුබුරු මිනිබිරි යන්ගේ ආදරයෙන් අද හීන්බණ්ඩා යුවළ ඔකඳ වන්නාහ.

ලන්ඩනයේ තිබෙන පන්සල්, විහාරස්ථාන හැමකම පාහේ පැවැත්වෙන ආගමික උත්සවවලදී නිරන්තරයෙන් මුණගැසෙන බණ්ඩයියා සහ ශීලාගෙන් විශාල ආගමික සේවාවක් වන බව කාටත් පැහැදිලි කරුණකි. එමෙන්ම භික්ෂූන්වහන්සේලාගේ දුක සැප සොයාබලා යම් මිදි පාඩුවක් ඇත්නම් එය අප්‍රමාදීව සපුරාලීමට ඒ දෙදෙනා කිදි විටෙකත් උකටලී වූ බවක් සටහන්ව නැත. ඒ අතින් බලන කල බණ්ඩයියා යනු ලන්ඩනයට පහළ වූ අනේපිඩු සිටාණන් කෙනෙකු ලෙස හැඳින්වීම කාලෝචිත නොවන්නේද?

ආදරණීය හීන්බණ්ඩා යුවළට අපි ඉත සිතින් දිගාසිරි පතන්නෙමු !

♦ විල්ෆ්‍රඩ් පෙරේරා
Berkshire UK

## London News

### The cigarette butt that is worth £80

Recently a young Sri Lankan man in Newham, East London, went to the Newham station with a lighted cigarette in his hand. Before going in, he dropped the stub on the ground outside the station and tread on it.

An environment officer who was just behind him asked the Sri Lankan to pick up the trampled cigarette butt. He gave him a small plastic bag to put it and asked him take it away with him. Then he issued a charge sheet with a **£80** fine to be paid at the Council office within a week.

Two years ago a law was passed that smokers who drop cigarette butts in the City of London would face an **£ 80** fine in a new crackdown on litter. But the majority living in London do not know about this new law.

According to the councils, every day about 7,000 cigarette butts are dropped in the City. Now environment officers are prowling - and issuing the fines to irresponsible smokers. Those who give false details will be fined £1,000.

### පවුම් 80ක් වටිනා සිගරැට් කොටය

**මේ** ළඟදී සිදුවූ දෙයකි. ලන්ඩනයේ වෙසෙන ලාංකික තරුණයෙක් නැගණහිර ලන්ඩනයේ නිව්හැම් දුම්රියපොළට ගියේ සිගරැට්ටුවක් උරමිනි. ඔහු ගොඩනැගිල්ලට ඇතුල්වන්නට පෙර සිගරට් කොටය බිම දමා පෑගීය.

එතැන ඔහු පිටුපසින්ම පරිසර ආරක්ෂක නිලධාරියෙක් සිට ඇත. නිලධාරියා බිම දැමූ සිගරැට් කොටය අහුලන ලෙස ලාංකිකයාට අණ කොට කුඩා ප්ලාස්ටික් බෑගයක් ද අතට දුන්නේ කොටය එහි දමා රැගෙන යන ලෙසටද කියමිනි. අනතුරුව ඔහු තරුණයාට පවුම් 80 ක දඩ කොලයක් ලියා දී එය සතියක් තුළ ගෙවන ලෙස කියා ඇත.

ලන්ඩන් නගරයේ දැන් පණවා ඇති මේ නීතිය බොහෝ දෙනෙක් නොදනිති. ඔබ දුම් බොන කෙනෙකු නම් ලන්ඩනයේ පාරක දී සිගරැට්ටුවක් දල්වන්නට පෙර **£ 80** ක් සාක්කුවේ ඇත්දැයි හොඳින් බලන්න!

♦ **Keerthi කීර්ති**


# The No. 1 Agent to Sri Lanka

HolidayAir
A Travel Experience to Remember

Do not book your Air Ticket with any other travel agent until you speak to us!

Best Value Deals to Colombo

| SriLankan | Oman Air | Jet Airways | Gulf Air | Kuwait Airways | Qatar Airways | Etihad | Emirates |
|---|---|---|---|---|---|---|---|
| £345 +Taxes | £200 +Taxes | £230 +Taxes | £250 +Taxes | £260 +Taxes | £320 +Taxes | £340 +Taxes | £420 +Taxes |
| 01 Jan – 31 Mar | 01 Jan – 15 July | 01 Jan – 31Mar | 01 Jan – 30 Jun | 01 Jan – 30 Mar | 01 Jan – 30 Jun | 01 Jan – 15 July | 01 Jan – 15 July |

0208 440 0770 www.holidayair.com

96 High Street, Barnet, Herts EN5 5SN Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm Closed- Sunday & Bank Holidays

IATA

